News Bulletin

Lanka Microfinance Practitioners' Association

# ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය

LMFPA පුවත් ප්‍රකාශනය 2013 ජුනි

## සමාජ කාර්යයසාධන කළමණාකරණය සඳහා වන විශ්ව සම්මුතින් 1 වන කොටස සමාජයීය අරමුණු අර්ථ දැක්වීම හා අධීක්ෂණය කිරීම

a) ආයතනට එහි සමාජයීය අරමුණු ලඟාකර ගැනීම සඳහා ක්‍රමෝපයක් ඇත

1) සමාජයීය මෙහෙවර : ආන්තික හෝ නොසලකා හරින ලද ඉලක්ක කණ්ඩායම් සඳහා මූල්‍ය සේවාවක් සඳහා ඩලඟාවීමට ඇති හැකියාව ඉහළ නැංවීමේ පුළුල් අරමුණට මෙහෙකරන සමාජයීය අරමුණු සහ මෙම සේවාලාභීන්ට ප්‍රතිලාභ ඇතිකර දීම

2) ඉලක්ක සේවාලාභීන් එහි ඉලක්ක සේවා ලාභීන්ගේ විශේෂිත ලක්ෂණ (උදා: ජන විකාශනය, සමාජ ආර්ථික, ව්‍යාපාරික ක්‍රියාකාරකම්) සහ මෙම සේවාලාභී කණ්ඩායම් වලට සේවා සැපයීම සමාජ මෙහෙයුමට උපකාර වන්නේ කෙසේද යන්න

3) සමාජයීය අරමුණු : සේවාලාභීන් මට්ටමින් විශේෂිත නිමැවුම් (උදා: ණය ග්‍රාමීය ගොවීන්ට කෘෂිකර්මික ණය) සහ ආයතන විසින් ලඟාකර ගැනීමට බලාපොරොත්තු වන ප්‍රථිපල (උදා: ගොවීන්ගේ වත්කම් වර්ධනය)

4) සමාජයීය දර්ශකය සෑම සමාජීය අරමුණක්ම ලඟාකර ගැනීම පිළිබඳ කාර්යසාධනය මැනීම සඳහා යොදාගන්නා දර්ශක (උදා: මාස 1 සිට 18 දක්වා වාර්තාව අන්දමට ගොවීන්ගේ වත්කම් වර්ධනය)

5) සමාජයීය ඉලක්ක: සේවාලාභීන්ගේ ප්‍රතිඵල සඳහා මැණිය හැකි ඉලක්ක (උදා: අළුතින් ලබාදුන් ණය වලින් 70% ක් ග්‍රාමීය ගොවීන්ට ලබාදීම) සහ නිමැවුම් (මෙම ගොවීන්ගේ 80% කගේම වත්කම් ප්‍රමාණය මාස 18 කට පසු වර්ධනය වී තිබුණි)

6) අරමුණු ලඟාකාර ගන්නේ කෙසේද? : නිෂ්පාදිතල සේවාවන්ල බෙදාහැරීමේ ආකෘතින් යන මාධ්‍යයන් ආයතනය විසින් මෙම සුවිශාල සහ නිමැවුම් ලඟාකර ගැනීමට යොදාගනු ඇත

b) ආයතනයේ සමාජයීය අරමුණු වලට විශේෂිත වූ සේවාලාභීන් පිළිබඳ නිවැරදි තොරතුරු එකතු කිරීම සහ වාර්තා සැපයීම ආයතනය විසින් සිදුකරනු ලැබේ.

1) ආයතනය විසින් එහි සෑම සමාජයීය අරමුණක් සඳහාම අවම වශයෙන් එක් දර්ශකයක් වත් යොදාගනිමින් තොරතුරු රැස්කරයි.

2) පහත කරුණු පිළිබඳ ආයතනය හඳුනා ගනී, දත්ත එකතු කරන්නේ කවුරුන්ද, දත්ත ගබඩාකර

තබන්නේ කෙසේද? දත්ත විශ්ලේෂණය කරන්නේ කවුද, දත්ත වල නිරවද්‍යභාවය තහවුරු කරන්නේ කවුද? එම දත්ත වාර්තා කරන්නේ කාටද? කෙසේද ?

3) දත්ත කළමණාකරණය කිරීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පද්ධතිය සතුව සේවාලාභීන්ගේ තහවුරු ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සහ අනිකුත් ප්‍රධාන ලක්ෂණ අනුව වෙන් කිරීමේ හැකියාව ඇත

4) ආයතනය විසින් එකතු කරන දත්ත වල ගුණාත්මකභාවය පහත කරණු මගින් තහවුරු කරනු ලබයි. 1) එකතු කරන ලද තොරතුරු වලංගු භාවයට පත්කිරීමෙන් සහ පද්ධතියට ඇතුළත් කිරීමෙන් සහ 2) දත්ත එකතු කිරීමේ මෙවලම් සහ දත්ත ඇතුලත් කිරීම පිළිබඳව සේවකයින් පුහුණු කිරීම.

5) ආයතනයක් එහි එක් සමාජයීය අරමුණක් ලෙස දරිද්‍රතාවය තුරන් කිරීම යන්න ප්‍රකාශ කරයි නම් දරිද්‍රතාවය මනින මෙවලමක් භාවිතා කරමින් එහි සේවාලාභීන්ගේ දරිද්‍රතාවයේ මට්ටම මනිනු ඇත. (උදාහරණ ලෙස එක පුද්ගල කුටුම්භ වියදම. ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව සමීක්ෂණය, දරිද්‍රතාවයෙන් ඉවත්ව යෑමේ කාර්ය සාධනය පිලිබඳ දර්ශකය, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ විගණන මෙවලම් යනාදිය)

6) ආයතනය එහි සමාජ කාර්යය සාධන තොරතුරු ප්‍රසිද්ධ ආකෘතියක් මගින් හෙළිදරව් කරයි. (පසං සමාජ කාර්ය සාධන දර්ශක ඇතුලත්ව) (උදා: ආයතනයේ වාර්ෂික වාර්තාවල එෂඩ ඒරනැළු වාර්තාවල ජාතික/ප්‍රාදේශීය සංගම් සඳහා වාර්තා කිරීම.)

## "පෝසත් පවුල්" වල කථා

" මූල්‍ය විනය පොහොසත්කමේ එකම හා සරලම රහසයි " යන්න "පෝසත් පවුල" වැඩසටහනේ මූලික තේමාවයි. සුළු මූල්‍ය වැඩසටහන් සඳහා සමාජ කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රායෝගික භාවිතයක් ලෙස "කඩිනම් සමාජ විපර්යාසයක් උදෙසා මූල්‍ය නිපුණතා හා ජීවන කුසලතා" වැඩසටහන 2012 දී ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනය විසින් සංවර්ධනය කර සුළු මූල්‍ය ක්ෂේත්‍ර යට හඳුන්වාදෙන ලදී. මෙම වැඩසටහන මගින් පුද්ගලයන්ගේ (කාන්තාවන්, පිරිමින්, ළමයින් හා තරුණ පිරිස්), පවුල්වල හා ප්‍රජාවන්ගේ මූල්‍ය නිපුණතා හා ජීවන කුසලතා වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ට ධනය හා වත්කම් ගොඩ නඟා ගැනීමට මඟ පෙන්වීමත් ඒ තුලින් ගැහැණු හා පිරිමි ළමයින්ගේ සුභ සිද්ධිය සඳහා ප්‍රමාණවත්, ඵලදායී හා අර්ථාන්විත ලෙස සම්පත් යොදා ගැනීමටත් ප්‍රජාවන් පෙළඹවීම සිදු කරයි .



කඩිනම් සමාජ විපර්යාසයක් උදෙසා මූල්‍ය නිපුණතා හා ජීවන කුසලතා වැඩසටහන "ධනය" මේ අයුරින් අර්ථ දක්වයි.

ධනය = පුද්ගල වත්කම්+මූල්‍ය වත්කම්+ආදායම් උත්පාදන වත්කම්+ භෞතික වත්කම්+තොරතුරු සම්බන්ධතා සඳහා වූ වත්කම්+ සමාජ වත්කම්+පාරිසරික වත්කම්

මෙහි ආරම්භක වැඩසටහන 2013 මැයි මාසයේදී පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ලෙස පැවැත්වුණු අතර දෙවෙනි වැඩසටහන සැප්තැම්බර් මස 2 සිට 6 දක්වා LMFPA හා Plan Sri Lanka ආයතනයේ මූලිකත්වයෙන් සිදුවේ.



## අර්ථවිදා පදනමේහි සාර්ථක කථාව - 40% සිට 5% දක්වා අවදානම් ණය කළඹ අවම කිරීම

1992 වර්ෂයේ ආරම්භ කර 2011 ජුනි දක්වා රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වු අර්ථචර්යා පදනම ලංකා ක්ෂුද්‍ර මුල්‍ය වෘත්තිකයන්ගේ සංගමය (LMFPA) සාමාජික ආයතනයක්ද අර්ථවිදා පදනමේ සහෝදර සමාගමක්ද වේ. අර්ථචර්යා පදනම ක්ෂුද්‍ර මුල්‍ය ක්ෂේත්‍රයේ මෙන්ම ක්ෂුද්‍ර මුල්‍ය නොවන කාර්යන්ගේද නිරත වියග ක්ෂුද්‍ර මුල්‍ය වැඩසටහන් ලෙස දුප්පත් පවුල් සඳහා ආදායම් උපයා ගැනීමේ කටයුතු අරඹයා කුඩා ණය සපයා දීමේ වැඩසටහන්ද ක්ෂුද්‍ර මුල්‍ය නොවන වැඩසටහන් ලෙස අපද්‍රව්‍ය කළමණාකරණය, ජල සැපයීම්, සනීපාරක්ෂක හා පෝෂණ වැඩසටහන් ද ක්‍රියාත්මක විය. ක්ෂුද්‍ර මුල්‍ය වැඩසටහන් 2011 වසරේ ජුලි මස සිට 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ අර්ථවිදා පදනමට පවරා දෙන ලදි.

වානිජ අරමුණු හා ස්වේච්ජා අරමුණු උදෙසා අර්ථචර්යා පදනම ක්ෂුද්‍ර මුල්‍ය හා ක්ෂුද්‍ර මුල්‍ය නොවන වැඩසටහන් ලෙස ක්ෂේත්‍ර 2ක් පවත්වා ගෙන යාමත් යහපත් ණය කළඹක් පවත්වගෙන යාමත් අතර අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය. අර්ථචර්යා පදනමට මහත් ශක්තියක් වු රබෝ බැංකුවත් කීර්තිමත් ජාත්‍යන්තර උපදේශන සමාගමක් හා අත්දැකීම් සපිරි දේශීය උපදේශන සමාගමක් වන මයික්‍රෝ සේව් ආයතනය හරහාත් අර්ථවිදා පදනම සඳහා තාක්ෂණික සහයද ලබා දෙන ලදී. රාබෝ බැංකුව 2009 වසරේදී තාක්ෂණික සහය ලබා දී තිබේ.

මෙලෙස අර්ථවිදා පදනමට තාක්ෂණික සහය ලබා දී එය මනාව ක්‍රියාවට නැංවීමෙන් වසර 2ක් වැනි කෙටි කාලයක් තුළ එහි අවදානම් ණය කළඹ 40% සිට 5% දක්වා අවම කිරීමට හැකි විය. අධික අවදානම් ණය කළඹක් ඇති ආයතනයක් යෝග්‍ය ණය කළඹක් පවත්වා ගෙන යාමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මෙය කදිම නිදසුනකිග එමෙන්ම අර්ථවිදා පදනමේ සාර්ථකත්වය අනෙකුත් ක්ෂුද්‍ර මුල්‍ය ආයතන වලට මහත් ආදර්ශයකි. මෙම සාර්ථක කතා පුවතේ සියලු විස්තර www.microfinance.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

*****************************

**මෙම ප්‍රකාශනයේ දැන්වීම් පල කිරීම සඳහා අමතන්න.**

කළමණාකරු
ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයන්ගේ සංගමය
112 A, මද්දුමගේවත්ත,
නුගේගොඩ.
දුක: +94 11 4367621, 4369612
ෆැක්ස්: +94 11 2827109
විද්‍යුත් තැපැල: info@lankamicrofinance.com
වෙබ් අඩවිය: www.microfinance.lk

මෙම පුවත් ප්‍රකාශනය සඳහා අනුග්‍රහය

Plan